ඔපෙක් අරමුදලින් මාර්ග ජාල සංවර්ධන ව්‍යාපෘතිය -2019
----------------------------------------------------------------

ඔපෙක් අරමුදලින් මාර්ග ජාල සංවර්ධන ව්‍යාපෘතියේ 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

**1.2** ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය
--------------------------------------------------------------------------------

ව්‍යාපෘතියේ ණය ගිවිසුම් අනුව, එවකට වරාය, නාවික හා මහාමාර්ග අමාත්‍යාංශය වර්තමානයේ මහාමාර්ග අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර, මාර්ග සංවර්ධන අධිකාරිය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. ශ්‍රී ලංකාවේ සංවර්ධන ප්‍රතිපත්ති රාමුවේ ප්‍රමුඛ ස්ථානයක් හිමිවන මාර්ග ජාල සම්බන්ධතා වැඩිදියුණු කිරීම සහ ප්‍රවාහන ක්ෂේත්‍රය සඳහා පවතින ඉල්ලුම සම්පූර්ණ කිරීම සඳහා බස්නාහිර, වයඹ, මධ්‍යම, දකුණ සහ සබරගමුව පළාත්වල ජාතික මාර්ග කි.මී. 202 ක් වැඩිදියුණු කිරීම සහ පාලම් පළල් කිරීම සහ පුළුල් කිරීම ව්‍යාපෘතියේ අරමුණු වේ. ණය ගිවිසුමට අනුව, ව්‍යාපෘතියේ ඇස්තමේන්තු ගත මුළු පිරිවැය රු. මිලියන 7,121.32 කට සමාන එ.ජ.ඩො. මිලියන 62.46 ක් වූ අතර ඉන් රු. මිලියන 4,560 කට සමාන එ.ජ.ඩො. මිලියන 40 ක් මූල්‍යනය කිරීමට අන්තර්ජාතික සංවර්ධනය සඳහා වූ ඔපෙක් අරමුදල එකඟ වී තිබුණි. රු.මිලියන 2,561.32 කට සමාන එ.ජ.ඩො. මිලියන 22.46 ක ඉතිරි මුදල ශ්‍රී ලංකා රජය විසින් මූල්‍යනය කල යුතුය. ව්‍යාපෘතියේ කටයුතු 2013 ජනවාරි 16 දින ආරම්භ කර තිබුණු අතර 2016 දෙසැම්බර් 31 දින වන විට අවසන් කිරීමට නියමිතය. කෙසේ වෙතත්, ව්‍යාපෘතියේ කටයුතු අවසන් කරන දිනය අවස්ථා දෙකකදී 2019 දෙසැම්බර් 31 දින දක්වා දීර්ඝ කර තිබුණි.

**1.3** තත්වාගණනය කළ මතය
------------------------------

මාගේ වාර්තාවේ 2.1 වගුවේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, ව්‍යාපෘතියේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

**1.4** මතය සඳහා පදනම
----------------------

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.5** මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම්
--------------------------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, ව්‍යපෘතිය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය ව්‍යපෘතිය ඇවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර

අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා ව්‍යාපෘතියේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

ව්‍යාපෘතියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරික්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

ව්‍යාපෘතියේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.6 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනිව හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බව අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. වරදක් නිසා සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදුකරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් හඳුනා නොගැනීම මගින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන අතර, දූස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල හා සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල සාධාරණත්වය ඇගයීම.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදී.

## 2. මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 2.1 ගිණුම්කරණ අඩුපාඩු

| අංකය | ගිණුම්කරණ අඩුපාඩුව | බලපෑම | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | ඉඩම් කට්ටි 126 ක් සඳහා වන්දි ගෙවීම ප්‍රමාද වීම මත රු.මි. 18 ක්වූ පොලී ගෙවීම් සඳහා මූල්‍ය ප්‍රකාශනවල ප්‍රතිපාදන සපයා නොතිබුණි. | වත්කම් සහ වගකීම් අවතක්සේරු වීම. | 2020 වර්ෂයේදී මූල්‍ය ප්‍රකාශනයේ ගෙවියයුතු වන්දි සඳහා උපචිත පොලිය සඳහන් කිරීමට සටහන් කරගතිමි. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිය අංක 08 අනුව ප්‍රතිපාදන සම්පාදනය කළ යුතුය. |
| (ආ) | මූල්‍ය ප්‍රකාශන සහ භාණ්ඩාගාරය විසින් පවත්වාගෙන යනු ලබන වාර්තා අනුව, ණය මුදලින් මුළු වියදම රු.මි. 67 කි. කෙසේ වෙතත්, විදේශ සම්පත් දෙපාර්තමේන්තුවේ වාර්තාවලට අනුව, එය රු.මි. 105 කි. මෙම වෙනස්කම් සඳහා හේතු විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. ඊට අමතරව, ව්‍යාපෘතිය විසින් 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශනවල රු.මි. 13 ක්වූ ප්‍රතිපූරණය කළහැකි විදේශාධාර, ණය යටතේ සටහන් කිරීම වෙනුවට වගකීම් යටතේ සටහන් කර තිබුණි. | වත්කම් සහ වගකීම් අවතක්සේරු වීම. | ඉදිරිපත් කර නොතිබුණි. | ණය ශේෂයන් සැසඳීමටත්, ණය මුදලින් ලැබෙන සියලුම මුදල් මූල්‍ය ප්‍රකාශනවල සටහන් කිරීමටත් කටයුතු කළ යුතුය. |

## 3. භෞතික කාර්ය සාධනය

### 3.1 ව්‍යාපෘතියේ ක්‍රියාකාරකම්වල භෞතික ප්‍රගතිය

| විගණන නිරීක්ෂණය | බලපෑම | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|
| 2019 දෙසැම්බර් මස මාසික ප්‍රගති වාර්තාවට අනුව, මාර්ග කොටසේ තත්‍ය භෞතික ප්‍රගතිය සහ සැලසුම්වල ප්‍රගතිය පිළිවෙලින් සියයට 56.61 ක් සහ සියයට 65 ක් පමණක් විය. | ඉදිකිරීම් කටයුතු නිම කිරීමේ ප්‍රමාදය හේතුවෙන් පිරිවැය ඉහලයාමට ඇති හැකියාව. | එකඟ වෙමි. ප්‍රධාන වශයෙන් අමුද්‍රව්‍ය සැපයුම් හිඟතාවය හේතුවෙන් කොන්ත්‍රාත්කරු ඉලක්කගත ප්‍රගතියක් අත්කර ගෙන නොතිබුණි. | පුනරුත්ථාපන කටයුතු කඩිනම් කිරීමට කටයුතු කළ යුතුය. |

**3.2** කොන්ත්‍රාත් පරිපාලනය

| අංකය | විගණන නිරීක්ෂණය | බලපෑම | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | ඒ 017 – ගාල්ල – දෙනියාය – මාදම්පේ පාර රක්වාන සිට මාදම්පේ දක්වා කොටසේ පුනරුත්ථාපන කටයුතු අවසන් කළයුතු දිනය ඉකුත්වී වසර හතරකුත් මාස තුනක් ගතවී තිබුණද, 2019 දෙසැම්බර් 31 දින දක්වා මාර්ග සංවර්ධන අධිකාරිය යටතේ ලියාපදිංචි කර තිබුණේ ඉඩම් 1,468 න් ඉඩම් කැබලි 126 ක් පමණක් විය. | ඉඩම් අවභාවිතා කිරීමට ඇති හැකියාව. | ප්‍රතිස්ථාපන ගත කිරීමේ කමිටු (LARQ) හේතුවෙන් පොලී ගෙවීමෙන් පසු ඉඩම් ලියාපදිංචි කළ යුතු අතර අදාළ ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල ඒ පිළිබඳ ප්‍රමාදයක් පවතින අතර, එම කටයුතු කඩිනම් කිරීම සඳහා දැනටමත් සිහිකැඳවීම් සිදුකර ඇත. | ඉඩම් අත්පත් කර ගැනීමේ කටයුතු කඩිනම් කිරීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | පේරාදෙණිය - බදුල්ල වෙන්කලඩි මාර්ග කොටස 2017 ජුනි 09 දින ආරම්භ කර තිබුණු අතර 2018 ජුනි 08 දින නිම කිරීමට සැලසුම් කර තිබුණි. කෙසේ වෙතත් ව්‍යාපෘති කාලය දින 77 කින් දීර්ඝ කර තිබුණි. මෙම දීර්ඝ කිරීම හේතුවෙන් මූලික හා සාමාන්‍ය අයිතම සඳහා රු.මි. 2.3 ක් ද උපදේශන අධීක්ෂණ වියදම් සඳහා රු.මි. 2.6 ක් ද අමතරව වැය කර තිබුණි. | ප්‍රමාදය නිසා අමතර වියදම් දැරීමට සිදුවිය හැක. | කි.මී. 0+920 සිට කි.මී. 2+630 කොටසේ ඉඩම් අත්පත් කර ගැනීමේ ප්‍රමාදය හේතුවෙන් දින 77 ක කාලය දීර්ඝ කිරීමක් ලබාදී ඇත. | පුනරුත්ථාපන කටයුතු කඩිනම් කර අවම ප්‍රමාදයකින් නිම කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | කොන්ත්‍රාත් පොදු කොන්දේසි 8.7 වගන්තියට අනුව, රු.මි. 40.8 ක ප්‍රමාද ගාස්තු කොන්ත්‍රාත්කරුගෙන් අය කර නොතිබුණි. | කොන්ත්‍රාත්කරුට අනිසි වාසි අත්වීම. | ප්‍රමාද ගාස්තු අඩු කිරීමට ක්‍රියාමාර්ග ගෙන තිබුණු අතර 2019.05.31 දක්වා රු.මි. 27 ක් අයකර ගන්නා ලදී. කෙසේ වෙතත්, කොන්ත්‍රාත්කරු ප්‍රමාද ගාස්තු අයකිරීම කල් දමන ලෙසත් එමෙන්ම ප්‍රමාද ගාස්තු යටතේ දැනටමත් අයකරගත් මුදල නිදහස් කරන ලෙසත් ඉල්ලා ඇත. | කාලය සම්බන්ධ ඉලක්ක සපුරා ගැනීම සඳහා කොන්ත්‍රාත්කරුවන්ට බලපෑම් කිරීම අවශ්‍ය වන අතර කොන්ත්‍රාත්තුවේ පිරිවැය වැඩිවීම සහ කාල සීමාව දීර්ඝ කිරීම වැළැක්විය යුතුය. |
| (ඈ) | මාර්ගය වලවල් නොමැතිව නඩත්තු කිරීම සඳහා ප්‍රමාණ පත්‍ර වටිනාකම රු. 465,000 ක් වන අතර රු. මිලියන 1.6 ක් | ව්‍යාපෘතියේ පිරිවැය වැඩි වීමට ඇති හැකියාව. | මෙම නඩත්තු කටයුතු සඳහා මාර්ග සංවර්ධන අධිකාරියේ සභාපතිවරයාගෙන් අනුමැතිය ලබාගෙන ඇති | පවතින මාර්ගවල නඩත්තුව සමීපව නිරීක්ෂණය කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| | ගෙවා තිබුණි. කෙසේ වෙතත්, ව්‍යාපෘතියේ මන්දගාමී ප්‍රගතිය සම්බන්ධයෙන් මහජන විරෝධතා හේතුවෙන්, කඩුගන්නාව විධායක ඉංජිනේරු කාර්යාලය තවත් රු.මි. 9.5 ක් ගෙවීමට ඇස්තමේන්තු කර තිබුණු අතර රු.මි. 7.7 ක් ගෙවා තිබුණි. මෙම ගෙවීම ගිවිසුම යටතේ පවතින මාර්ගයේ නඩත්තු වටිනාකමෙන් සියයට 485 ක් වූ අතර එවැනි නඩත්තුවක් සඳහා පූර්ව අනුමැතියක් ලබාගෙන නොතිබුණි. | | අතර පිරිවැය කොන්ත්‍රාත්කරුගෙන් අයකර ගැනීමට නියමිතය. | |
| (ඉ) | විශේෂ කොන්දේසි අංක 119.1 උප වගන්තියට අනුව, කොන්ත්‍රාත්තුව ක්‍රියාත්මක වන කාලය තුළ වලංගුව පවතින රක්‍ෂණයන් පවත්වාගෙන යා යුතුය. කෙසේ වෙතත්, කොන්ත්‍රාත්කරු රක්ෂණ ඔප්පු 3 ක දින දීර්ඝ කර නොතිබුණු අතර, 2019 දෙසැම්බර් 31 සහ 2020 මැයි 31 වන විට ලබා ගත් භෞතික ප්‍රගතිය ද පිළිවෙලින් සියයට 56.61 ක් සහ සියයට 67.56 ක් විය. | කොන්ත්‍රාත් වැඩ, කම්කරුවන් සහ තෙවන පාර්ශවය සඳහා රක්ෂණ ආවරණයක් නොමැතිව ඉදිකිරීම් සිදුකරගෙන යාමේ හැකියාව. | එකඟවෙමි. සියලුම රක්‍ෂණ අලුත් කරන ලෙස කොන්ත්‍රාත්කරුට අවස්ථා කිහිපයකදී සිහිකැඳවීම් සිදුකර තිබුණු අතර සියලුම රක්‍ෂණවල වලංගු කාලය 2020 නොවැම්බර් අවසානය දක්වා දීර්ඝ කරන ලදී. | සියලුම රක්ෂණ අලුත් කිරීම් නියමිත වේලාවට ලබා ගැනීම අවශ්‍ය වේ. |
| (ඊ) | කොන්ත්‍රාත් පොදු කොන්දේසි 8.7 උප වගන්තිය සහ උපදේශකවරයාගේ නිර්දේශය සැලකිල්ලට නොගෙන, කොන්ත්‍රාත්කරුගෙන් රු.මි. 27 ක ප්‍රමාද ගාස්තු සේවායෝජක විසින් අය කර නොතිබුණි.<br>ව්‍යාපෘතිය මගින් කොන්ත්‍රාත්කරුට එවැනි අමතර මූල්‍ය පහසුකම් සපයා තිබුණද, 2018 අගෝස්තු සිට 2020 මැයි දක්වා භෞතික ප්‍රගතිය සියයට 40.19 කින් පමණක් ඉහළ ගොස් තිබුණි. | කොන්ත්‍රාත්කරු විසින් අමතර මූල්‍ය පහසුකම් ලබා ගැනීමේ හැකියාව. | එකඟවෙමි. | ඉදිකිරීම් කොන්ත්‍රාත්තුවේ කොන්දේසි වලට අනුකූලව කටයුතු කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| (උ) | මූල්‍ය ප්‍රගතිය සියයට **49.53** ක් අත් කරගෙන තිබුණද, කොන්ත්‍රාත් පොදු කොන්දේසි **14.2** උප වගන්තියට අනුව **2019** දෙසැම්බර් **31** දිනවන විට ව්‍යාපෘතිය වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම් අයකර ගැනීම ආරම්භ කර නොතිබුණි. | කොන්ත්‍රාත්කරුට අනවශ්‍ය මූල්‍ය ප්‍රතිලාභ අත්වීම. | ව්‍යාපෘතිය සැලකිය යුතු ප්‍රගතියක් ලබා ගන්නා තෙක් කොන්ත්‍රාත්කරු විසින් අත්තිකාරම් අයකර ගැනීම් වෙනස් කරන ලෙස ඉල්ලා ඇත. කෙසේ වෙතත්, නියමිත මුදලම අයකර ගැනීමට කටයුතු කර ඇත. | වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම් නියමිත වේලාවට අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඌ) | කොන්ත්‍රාත්තුවේ විශේෂ කොන්දේසි **14.3** සහ **14.6** උප වගන්තිවලට අනුව, කොන්ත්‍රාත්කරු විසින් ඉදිරිපත් කළ යුතු අතුරු ගෙවීම් සහතිකයේ අවම මාසික මුදල කොන්ත්‍රාත්තුවේ වටිනාකමින් සියයට **3** කි. කෙසේ වෙතත්, **2019** දෙසැම්බර් මාසය සඳහා වූ අතුරු ගෙවීම් සහතිකය හැර, අනෙකුත් සියලුම අතුරු ගෙවීම් සහතික නියමිත සීමාවට වඩා අඩුවෙන් ඉදිරිපත් කර තිබුණි. | අතුරු ගෙවීම් ඇගයීමේ පිරිවැය සීමා ඉක්මවා යාම. | එකඟවෙමි. | කොන්ත්‍රාත්කරුවන් සඳහා වන අනවශ්‍ය අනුග්‍රහය, පිරිවැය සහ කාලය අවම කර ගැනීම සඳහා කොන්ත්‍රාත්තුවේ කොන්දේසිවල නියම කර ඇති සීමාවන්ට අනුකූල වීම අවශ්‍ය වේ. |
| (එ) | අදාළ කොන්ත්‍රාත්කරුගේ වියදමින් කාර්ය සාධන බැඳුම්කර ලබාගත යුතු බවට වූ කොන්ත්‍රාත්තුවේ පොදු කොන්දේසිවල **4.2** උප වගන්තිය යටතේ දක්වා ඇති කොන්දේසිවලට පටහැනිව, කොන්ත්‍රාත්කරුවන්ට කාර්ය සාධන බැඳුම්කර ලබා ගැනීමේ පිරිවැය සඳහන් කිරීමට ඉඩ සලසමින් මාර්ග ප්‍රතිසංස්කරණ කටයුතු පිළිබඳ ප්‍රමාණ පත්‍රවල වෙනම ගෙවීම් අයිතම සකස් කර තිබුණි. ඒ අනුව පේරාදෙණිය - බදුල්ල වෙන්කලඩි පාරේ කොන්ත්‍රාත්කරු ලබාගත් කාර්ය සාධන බැඳුම්කරවල පිරිවැය ප්‍රතිපූරණය කිරීම සඳහා කොන්ත්‍රාත්කරුවන්ට රු. මිලියනයක මුදලක් අතිරේකව ගෙවා තිබුණි. | කොන්ත්‍රාත්කරුවන්ට අනවශ්‍ය වාසි අත්වීම. | කොන්ත්‍රාත් කොන්දේසිවල **4.2** උප වගන්තියට අනුව, කොන්ත්‍රාත්කරු තමාගේ වියදමින් කාර්ය සාධන බැඳුම්කර සැපයිය යුතුය. කෙසේ වෙතත්, සාමාන්‍යයෙන් ඒ සඳහා ප්‍රමාණ පත්‍ර අයිතම සපයන අතර, එසේ නොමැති නම්, කොන්ත්‍රාත්කරුට මෙම පිරිවැය අනෙකුත් ප්‍රමාණ පත්‍ර අයිතමවලට ඇතුළත් කිරීමට/බෙදා හැරීමට සිදුවේ. | වැඩිපුර ගෙවූ මුදල අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| (ඒ) | දුම්රිය දෙපාර්තමේන්තුවට අනුව, 0+580 මාර්ග කොටසේ දුම්රිය හරස් මාර්ගය මාරු කිරීම සඳහා ඇස්තමේන්තුගත මුදල රු.මි. 9.2 ක් වූ අතර ඔවුන්ගේ සේවාවන් හැකි ඉක්මනින් ලබා ගැනීම සඳහා මුදල් ගෙවන ලෙස උපදේශකවරයා 2018 මාර්තු 14 දින කොන්ත්‍රාත්කරුට උපදෙස් දී තිබුණි. එහෙත් වසර 2 යි මාස 4 ක් ගතවී ඇතත්, 2019 දෙසැම්බර් 31 දින දක්වාවත් ගෙවීම් කර නොතිබුණි. මෙම තත්ත්වය ව්‍යාපෘතියේ ප්‍රගතියට දැඩි ලෙස බලපා ඇති නමුත් ව්‍යාපෘතියේ ක්‍රියාකාරිත්වය වේගවත් කිරීමට කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. | ඉදිකිරීම් ක්‍රියාවලිය ප්‍රමාද කිරීමට සහ ව්‍යාපෘතියේ පිරිවැය වැඩිවීමට ඇති හැකියාව. | එකඟවෙමි. | යටිතල පහසුකම් වෙනස් කිරීමේ ක්‍රියාවලිය වේගවත් කිරීමට පියවර ගත යුතුය. |